# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2003/38 - 2017 ජනවාරි මස 27 වැනි සිකුරාදා - 2017.01.27

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# III වැනි කොටස - ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

7 වැනි වගන්තිය යටතේ දැන්වීමයි

*මගේ අංකය* : MUL/LND/02/ACQ/22.
*ඉඩම් අමාත්‍යාංශයේ යොමු අංකය* : LD/5/2007/CA/196.

මහජන කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දැක්වෙන ඉඩම්/ පරවශතාව ලබා ගැනීමට රජය අදහස් කරන බැව්, 1964 අංක 28 දරන ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධන) පනතින් සංශෝධිත පරිදි ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

*ලබා ගැනීමට බලාපොරොත්තු වන ඉඩමේ විස්තර* :

දකුණු පළාතේ, මාතර දිස්ත්‍රික්කයේ, මුලටියන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, නෙරලම්පිටිය ග්‍රාම නිලධාරි වසමට අයත් මුලටියන ගමේ පිහිටි සර්වේයර් ජනරාල්ගේ අංක අ.ග.පි. 129, අතිරේක අංක 13, පත්‍රය 18 දරන සැලැස්මේ පෙන්නුම් කර ඇති පහත විස්තර සඳහන් ඉඩම් කැබලි.

01. **කැබලි අංක 228**
ඉඩමේ නම: ඉහලවත්ත; ඉඩමේ විස්තරය: ගෙවත්ත, ස්ථිර ගොඩනැගිලි දෙකක් (2) වැසිකිළියක් සහ ජල ටැංකියක් ඇත; හිමිකම් කියන අය: නැසීගිය පියදාස රත්නායක වෙනුවෙන් ආරියලතා හේමාලි රත්නායක, එන්. බී. රත්නායක, අනුරුද්ධ දේවප්‍රිය රත්නායක, දුනිඳු රත්නායක, රේණුකා රත්නායක, ධම්මිකා රමණී රත්නායක, රංජනී රත්නායක සහ සුධර්මාවෝ ජිනානි රත්නායක; ප්‍රමාණය: හෙක්. 0.2702.

02. **කැබලි අංක 229**
ඉඩමේ නම: ඉලංගංවත්ත හෙවත් කිරිලපනේවත්ත; ඉඩමේ විස්තරය: ගෙවත්ත, ස්ථිර ගොඩනැගිල්ලක් සහ බුදු මැදුරක් ඇත; හිමිකම් කියන අය: එල්. එච්. රණසිංහ; ප්‍රමාණය: හෙක්. 0.0371.

ඉහත සඳහන් ඉඩමට/පරවශතාවයට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලු දෙනාම තම තමන් හෝ ඔවුන්ගෙන් ලියවිලිවලින් බලයලත් අයවළුන් හෝ 2017 මාර්තු මස 29 වැනි දින පෙ.ව. 10.00 ට මුලටියන ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී මා සම්මුඛ විය යුතු ය.

තව ද, 2017 මාර්තු මස 22 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම/ ඉඩම් සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයත් එකී ඉඩම/පරවශතාවය ලබාගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත්, වන්දි මුදල හා එම වන්දි මුදල ගණන් බැලූ ආකාරයත් මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම් දිය යුතු යි.

සුසන්ත අත්තනායක,
ප්‍රාදේශීය ලේකම්,
මුලටියන.

2017 ජනවාරි මස 25 වැනි දින,
මුලටියන ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

02 - 536

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

1A - G 25001 - 32 (2017/01)